**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 2 කොටස පිළිබඳ ව්‍යාපෘතිය - 2023**

-----------------------------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 2 කොටස පිළිබඳ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 දින එළඹි අංක 3625- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 4.02(අ) වගන්තිය සහ එළඹි අංක 3626- එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුමේ 4.02(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වැඩසටහන් ප්‍රදේශයේ කෘෂිකාර්මික, පානීය හා වාණිජ කටයුතු සඳහා ජල සම්පත් සඳහා ආරක්ෂිත ප්‍රවේශය වැඩසටහනේ අරමුණු වේ.උතුරු මැද පළාත් ඇළ ඉදිකිරීම් ව්‍යාපෘතිය සහ වයඹ පළාත් ඇළ ඉදිකිරීම් ව්‍යාපෘතිය යන කොටස් දෙකක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 38,177.67 ට සමාන එ.ජ.ඩො මිලියන 242 ක් වූ අතර ඉන් රු.මිලියන 33,129.39 ට සමාන වූ එ.ජ.ඩො මිලියන 210 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි.ඉතිරි මුදල රු.මිලියන 5,048.28 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු කෙරේ.

වැඩසටහෙන් කටයුතු 2017 දෙසැම්බර් 13 වන දින කටයුතු ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කරන දිනය 2025 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ඇල ඉදිකිරීම මඟින් මහකනදරාව ජලාශයට ජලය ලබාගෙන ඒ මඟින් රඹෑව, මැදවච්චිය ප්‍රදේශ වලට පානීය ජලය සැපයීම සඳහා රු. මිලියන 11,515ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජපාන අන්තර් ජාතික සහයෝගිතා ආයතනයෙන් ලබාගත් ණය මුදලක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදවාගෙන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර එහි වැඩ කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණි. එසේ වුවද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි. | එකඟ වේ. | ප්‍රමුඛ කාර්යය හඳුනාගෙන ව්‍යාපෘතියේ නියමිත කාල සීමාව තුල සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට මොරගහකන්ද ජලාශයේ සිට කනදරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් නිම කිරීමට මේවන විට සැලසුම් කර ඇත. මේ හේතුවෙන් කි.මී. 68.3ක් වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර සමස්ථ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දිනය වන තුරු ඉදිරිපත්ව නොතිබුණි. | ඉතිරි කොන්ත්‍රාත් පැකේජ ප්‍රසම්පාදනය සඳහා සියලුම ලියකියවිලි සූදානම්ව පවතී. ඕනෑම අවස්ථාවක, අරමුදල් ප්‍රතිපාදන ලද පසු මේවා ප්‍රසම්පාදනය කර ප්‍රදානය කළ හැකිය. මූල්‍ය කටයුතු සංවිධානය කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විවිධ ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන සමඟ සාකච්ඡා පවත්වනු ලැබේ. | ඉතිරි වැඩ සඳහා නිශ්චිත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතුය. |
| (ඇ) | දේශීය කෘෂිකාර්මික බෝග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහවැලි කලාප 5ක හා හුරුළු වැව ප්‍රදේශවල ගොවීන්ට දෙමුහුම් මිරිස් බීජ දේශියව නිෂ්පාදනය කිරීම සඳහා Poly Tunnel ඒකක 50ක් සපයා සවිකිරීමේ උප ව්‍යාපෘතියක් රු.මිලියන 91.57ක කොන්ත්‍රාත් වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු Poly Tunnel සකස් කිරීම සම්බන්ධ පූර්ව පළපුරුද්ද රහිත වූ අතර 2018-2020 කාලය තුළ අලාභ ලබා 2021 වසරේ පමණක් ලාභයක් ලැබූ එනම් දුර්වල මූල්‍ය ශක්‍යතාවයක් සහිත සමාගමක් විය.ගිවිසුම අනුව 2023 මැයි 15 දිනට කාර්ය නිම කළයුතු වුවද 2024 අප්‍රේල් 30 දිනවන විටත් Poly Tunnel 42ක් පමණක් සවිකර තිබුණු අතර 2024 මැයි 31 දක්වා අවස්ථා තුනකදී කාලය දීර්ඝ කර තිබුණි. | අවසන් කිරීමේ නවතම කාලය (31 මැයි 2024) ඉක්මවා යන ඕනෑම ප්‍රමාදයක් කොන්ත්‍රාත්තුවට අනුව සලකනු ලැබේ. | නිසි සැලැස්මක් ලබා ගැනීම සහ දීර්ඝ කරන ලද දිනය වන විට අදාළ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අධීක්ෂණය කිරීම කළ යුතු වේ. |
| (ඈ) | වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී රු. මිලියන 7,146.91 ක වටිනාකමට පිරිනමා තිබූ කළුගඟ - මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2021 සැප්තැම්බර් 10 දින නිමකල යුතු වුවත් නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීම නිසා 2023 දෙසැම්බර් 21 දක්වා දීර්ඝ කර තිබුණි.එසේ වුවද, එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වූ අතර, 2024 මැයි 31 දිනට කොන්ත්‍රාත්තුව නිම කිරීමට හැකි වෙතැයි ඇස්තමේන්තු කර තිබුණද 2023 දෙසැම්බර් 21 දිනෙන් පසු දින දීර්ඝයන් ලබා දී නොතිබුණි. | 2024 අගෝස්තු 31 දක්වා තවත් දීර්ඝ කිරීමක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. | කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට හේතු සොයා බැලීමට ක්‍රියා කළ යුතු අතර සම්පූර්ණ කිරීමට සාධාරණ කාලයක් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2018 සිට 2023 දක්වා කාලසීමාව සඳහා වෙන් කරන ලද අරමුදල් ඌන උපයෝජනය කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 229.23 ක බැඳීම් ගාස්තුව ගෙවා ඇත. | විවිධ හේතු නිසා ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. | නොසැලකිලිමත්කම සඳහා හේතු සොයා බැලීම සහ සැලැස්ම අනුව ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |

## 2.2 මතභේදාත්මක කරුණු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උක්ත ඇළ මාර්ගය ඉදිකිරීමේදී මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය ඊට අනුකූලව කටයුතු නොකර තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස දක්වමින් පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කර උමඟ හරහා ජලය ගෙනයෑමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි. | එකඟ නොවේ.<br>NCPCP ඇල සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අවධීන් තුළදී, තාක්ෂණික වශයෙන් සුදුසු, ජාතික වශයෙන් ඵලදායී සහ පාරිසරික වශයෙන් අවම බලපෑමක් ඇති ක්‍රම සම්පූර්ණ කරමින් පාරිසරික බලපෑම් තක්සේරුවේ තත්ත්වයට ඉඩ සැලසීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇත. ඒ අනුව බොහෝ ප්‍රදේශ කැපුම් සහ ආවරණ ද්විත්ව නල මාර්ගයකින් සහ උමං මාර්ගයකින් ආවරණය විය. | නිසි තාක්ෂණික හා ඵලදායී ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | උපදේශන සමාගම විසින් උමං විදුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, වැඩබිම වෙත ප්‍රවාහණය කර සවි කිරීම සඳහා රු. මිලියන 7,255.40ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු. මිලියන 6,690.97 ක මිලක් ඉදිරිපත් කර තිබුණු අතර යන්ත්‍ර 02 ආනයනය කිරීමේදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් අනුව එම යන්ත්‍ර 02 හි CIF වටිනාකම් පිළිවෙළින් එ.ජ.ඩො. 10,581,673කට සමාන රු.මිලියන 2,147.97 ක් හා එ.ජ.ඩො. 9,476,342 කට සමාන රු. මිලියන 3,523.61 ක් වී තිබුණි. ඒ අනුව උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී යන්ත්‍රයක වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා නොගෙන මෙම අයිතමය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි. | ඇස්තමේන්තුගත අගය සහ CIF අගය සැසඳිය නොහැක.<br>ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකම නිෂ්පාදනයේ අපේක්ෂිත CIF අගය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය හා සම්බන්ධ සියලුම බදු, හැසිරවීමේ ගාස්තු, වරායේ සිට වැඩ බිමට ප්‍රවාහනය, ස්ථාපනය එකලස් කිරීම, දියත් කිරීම සහ කොමිස් කිරීම + ලකුණු - දක්වා ආවරණය කරනු ලැබේ. | අදාළ සියලු මූලාශ්‍ර සහ සාධක සලකා බලා ඇස්තමේන්තු සකස් කර සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) | 01 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් නිකුත් කරන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ | • මෙම කොන්ත්‍රාත්තුවේ තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇත.<br>• කැබිනට් අනුමැතිය හරහා සාරානුකූලව ප්‍රතිචාර දක්වන අඩුම මිල දක්වන ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.<br>• එක්වරක් අයිතම සඳහා උපුටා | පිරිවැය විමර්ශනය කර වැඩිපුර ගෙවීම් සිදුකර ඇත්නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලාභය වෙනුවෙන් රු. මිලියන 4,535ක විශාල මුදලක් එනම් මුළු පිරිවැයෙන් සියයට 68ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි. | දක්වන ලද අනුපාතය (3.4.1.1) යනු ලංසුකරු විසින් සඳහන් කර ඇති තරඟකාරී මිලයි.<br>• කොන්ත්‍රාත්තුවේ විධිවිධාන අනුව ගෙවීම් සිදු කර ඇත. | |
| (ඈ) | 02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්, රු. මිලියන 6,021.87 ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් නිකුත් කරන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 3,635.61 ක් වී තිබුණි. ඒ අනුව, ත්‍රිකුණාමලය සිට කෝදුරුවාව දක්වා ප්‍රවාහනය කර යන්ත්‍රය එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු. මිලියන 3,055.36ක හෙවත් පිරිවැයෙන් සියයට 46ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි. | ඉහත දී ඇති ප්‍රතිචාරය සලකා බැලිය යුතු වේ. | පිරිවැය විමර්ශනය කර වැඩිපුර ගෙවීම් සිදුකර ඇත්නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර 2 ½ ක් ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2027 මාර්තු 10 දක්වා දීර්ඝ කර තිබුණු අතර ව්‍යාපෘතිය කඩිනම් කිරීම යටතේ 2025 ජුනි මාසයේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට Drill & Blasting ක්‍රමය යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ කි.මී. 10.4 ක් වූ දුර ඉදිකිරීම සඳහා 02 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට තීරණය කර තිබුණි. එහිදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබූ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් 02 වෙනි උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම නිර්දේශ කර නොතිබුණි. අනතුරුව අමාත්‍යාංශ ලේකම් විසින් විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර තිබුණු අතර එම කමිටුව විසින්ද යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවට හා කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එම කමිටුවේ තීරණයද පිළිගැනීමට කටයුතු කර නොතිබූ අතර නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් 2021 ඔක්තෝම්බර් 14 වැනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ දී අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. | • TBM යන්ත්‍ර 2ක් සමඟ සංශෝධිත කොන්ත්‍රාත් කාලය. (2025 ජුනි 8)<br>• ස්වභාවයෙන්ම මෙම ව්‍යාපෘතියට සමාන වන උමා ඔය ව්‍යාපෘතියේ ජල ප්‍රවේශය පිළිබඳ අත්දැකීම් තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වසර 2 ½ ක් සඳහා තාවකාලිකව නතර කරන ලදී.<br>ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුවරයාගේ නිර්දේශය ඇතිව සහ ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ඇතිව දෙවන TBM යෙදවීමේ වාසි සලකා බැලීමෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යකරණය (MFF) ලබා ගත හැකි කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කෙරේ. | මෙම මිලදී ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටු දෙකකින් නිර්දේශ නොකළ විට විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නිර්දේශ ලබාගෙන වැඩි මිලට මෙම උමං විදුම් යන්ත්‍රය ආනයනය කිරීමට කටයුතු කළ පාර්ශ්වයන් මීට වගකිව යුතු වේ. එබැවින් එම පාර්ශවයට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතු අතර මිලදී ගැනීම සම්බන්ධ සියලු කරුණු කැබිනට් මණ්ඩලයට දැනුම් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කාර්ය ඇස්තමේන්තුව අනුව කොන්ත්‍රාත්තුව අවසානයේදි විදුම් යන්ත්‍ර 2 ගලවා වරාය දක්වා ප්‍රවාහනය කිරිම වෙනුවෙන් රු. මිලියන 179.99 ක් ප්‍රමාණ පත්‍රයට ඇතුල් කර තිබුණි. එහිදී රු. මිලියන 13,381.94 ක් වටිනා යන්ත්‍ර 2 වෙනුවෙන් ගෙවූ පිරිවැයෙන් ප්‍රමාණවත් මුදලක් තක්සේරු කර නැවත ලබා ගැනීමට ගිවිසුම් මගින් එකග වී නොතිබූ අතර යන්ත්‍ර 2 කිසිදු අයකිරීමක් රහිතව මෙරටින් රැගෙන යාමට එකඟ වී තිබුණි. | • මෙම සියලු ක්‍රියා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලංසු ලේඛනයේ සේවා යෝජකයාගේ අවශ්‍යතාවයට අනුකූල වේ.<br>• යන්ත්‍ර සඳහා ගෙවන ලද මුදල කොන්ත්‍රාත්තුවේ එකඟ වූ එක්වරක් සඳහා වන ගාස්තු වේ. | කොන්ත්‍රාත්තුව අවසානයේ යන්ත්‍ර 02 ප්‍රතිඅපනයනය කිරීමේදී එහි වටිනාකම තක්සේරු කර කොන්ත්‍රාත්කරුගෙන් සාධාරණ මුදලක් අය කළ යුතු අතර ඒ සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ අදාළ වගන්ති සංශෝධනය කළ යුතුය. |
| (උ) | ඇළ මාර්ගයේ 03 වන උමඟෙහි උමං විදුම් යන්ත්‍රයක් යොදාගෙන කැණීම් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මේ දක්වා අවසර ලබා දී නොතිබුණි. එසේ වුවද, දැනට වලංගුව පවතින කැණීම් බලපත්‍රය භාවිතයෙන් 1 වන උමං විදුම් යන්ත්‍රය යොදාගෙන එම උමඟෙහි කි.මී. 5.77 ක් දුරක් කැණීම් කර තිබුණි. | පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ පවා GSMB වෙතින් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාව සඳහන් කර නොමැත. ව්‍යාපෘතියේ රැස්වීම අතරතුර පවා GSMB හි නිලධාරීන් පැමිණ සිටියද ඔවුන් කිසිවෙක් එවැනි බලපත්‍රයක් අවශ්‍ය බව මතු කළේ නැත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් GSMB වෙතින් අවශ්‍යතාවය පිළිබඳව ලිඛිතව විමසා තිබුණද මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත. | පතල් කැණීමේ බලපත්‍රය GSMB වෙතින් ලබාගත යුතුය. |
| (ඌ) | උමං මාර්ගයේ දුර්වල පාෂාණ ඇති ස්ථාන වලට කොන්ක්‍රීට් වළලු (Ring) යෙදීම සඳහා එම වළලු සකස් කිරීමට රු. මිලියන 2,892.3 ක්, වළලු සකස් කිරීමේ කම්හලක් හා ගබඩාවක් ඉදිකිරීමට පිළිවෙළින් රු. මිලියන 928.72 ක් හා රු. මිලියන 149.82 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව මෙම කම්හලේ නිෂ්පාදනය කර 2024 ජනවාරි 31 දිනට උමං මාර්ගයේ සවිකරන ලද කොන්ක්‍රීට් වළලු 2,967 න් වළලු 1,298 ක් එනම් සියයට 44 ක් විවිධ ස්ථාන වලින් පුපුරා තිබුණු බවට හඳුනාගෙන තිබුණි. | මෙහි දක්වා ඇති අගයන් අදාළ BOQ අයිතම සමඟ හෝ හඳුනාගත් ඉරිතැලීම් පිළිබඳ අඩවි වාර්තා සමඟ නොසැසඳෙන නමුත්, එම සිද්ධිය සිදු වූ ලෙස පිළිගනු ලැබේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ඉංජිනේරු සහ කොන්ත්‍රාත්කරුගේ විශේෂඥයින් හේතු සහ නිවැරදි කිරීමේ ක්‍රම හඳුනාගැනීමේ නිරත වී ඇත. සේවායෝජකයා ද සිදුවෙමින් පවතින පිළියම් යෙදීම් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කර ඇත. | මෙම ගැටළුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (එ) | කි.මී. 27.7 දිග උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 21 ක් විය. කොන්ත්‍රාත්තුවේ සිදුවන මිල විචලන සඳහා ගෙවීමට රු. මිලියන 3,001.79 ක් වෙන් කර තිබුණත් 2023 දෙසැම්බර් 31 වන විටත් එයින් රු. මිලියන 5,131.24 ක් වැය කර තිබුණි. ඒ අනුව කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතියකින් තොරව රු.මිලියන 2,129.45ක් වැඩියෙන් ගෙවා තිබුණි.. | සාමාන්‍ය පිළිවෙත වන්නේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් කලින් අනුමත කරන ලද පිළිගත් කොන්ත්‍රාත් මිල ඉක්මවන විට මුළු වියදම සටහන් වූ පසු කොන්ත්‍රාත් මිල සංශෝධනය කිරීමයි. තවමත් මෙම කොන්ත්‍රාත්තුවේ එම තත්ත්වය ඇතිවී නොමැත. | අතිරේක ගෙවීම් සඳහා කැබිනට් අනුමැතිය ලබාගත යුතුය. |

## 2.3 නිෂ්ක්‍රීය සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ආනයනය කරන ලද 2 වන උමං විදුම් යන්ත්‍රය 2023 මාර්තු සිට 2024 මාර්තු දක්වා තාවකාලිකව ක්‍රියාත්මක නොකිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණයකර තිබීම හේතුවෙන් යන්ත්‍රය සවිකිරීමෙන් පසු 2023 මාර්තු සිට මාස 8 ක කාලයක් නිෂ්කාර්යයව තිබී 2023 නොවැම්බර් 23 සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණි. එදින සිට 2024 පෙබරවාරි 29 දින දක්වා මාස 3 ක කාලයකට ප්‍රගතිය මීටර් 400 ක අවම මට්ටමක පැවතුණි. | සටහන් කරගෙන ඇත. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.4 පෙර විගණන වාර්තාවේ පෙන්වා දුන් නොවිසඳුනු කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන යටතේ 2022 වර්ෂයේ මිලදී ගත් පොහොර තොගයක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර සමාගම් 02 කට භාරදීමේදී රු.මිලියන 55.23 ක් වටිනා පොහොර මෙට්‍රික් ටොන් 161.5 (බෑග් 3,230) ක ඌණතාවයක් ඇති වී තිබුණි. | මෙම ගැටළුව පිළිබඳව සොයා බැලීමේ කටයුතු ආරම්භ කර ඇත.මෙම තොරතුරු 2024 වන විට මූල්‍ය ප්‍රකාශනවල "සටහන" ලෙස හෙළිදරව් කෙරේ. | අලාභය අදාළ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අලාභය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |

## 2.5 ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ ගැටළු

ව්‍යාපෘතිය මගින් පෞද්ගලික ඉඩම් කැබලි 644ක් පවරා ගැනීමට සිදු වූ නමුත් අත්පත් කරගත් ඉඩම් කැබලි ගණන 385ක් පමණක් වන අතර ඒවායේ කිසිඳු අයිතියක් පවරා නොතිබුණි.